# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,263 - 2022 ජනවාරි මස 13 වැනි සිකුරාදා - 2022.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — | වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — | පිස්කල් විකිණීම ... ... ... | 10 |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — | බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 12 |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | 14 |


*සැ. යු.-* (i) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 පෙබරවාරි මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජනවාරි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

9- B 0822307 — 353 (2022/02)
D 1 -

# පිස්කල් විකිණීම්

## මහනුවර දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

මහනුවර, කටුගස්තොට පාර, අංක 187 හි ප්‍රධාන කාර්යාලය පිහිටි සෙරෙන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්.

මහනුවර දිසා අධිකරණයේ
නඩු අංකය : DMB 00040/17
ඇස්කිසි අංකය : 99/21

................*පැමිණිලිකාර සමාගම.*

*එදිරිව*

01. හේරත් මුදියන්සේලාගේ චමින්ද රත්නායක,
අංක 1/125, රිටිගල වත්ත, ඇඹිල්මීගම
පිළිමතලාව.

....................*විත්තිකරුවන්.*

වර්ෂ 2019ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් අසූ හතර ලක්ෂ හැට අට දහස් දෙසිය අනූ එකයි දශම හතලිස් හය (රු. 8,468,291.46) ක මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා ආඥකොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් අසූ හතර ලක්ෂ හැට අට දහස් දෙසිය අනූ එකයි දශම හතළිස් හය (රු. 8, 468,291.46) ක මුදල සහ එකී මුදල මත 2017.07.07 දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා 19% බැගින් පොළිය ද පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ, හා උ ඡේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපලට අයත් සියළුම අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියළු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපලෙන් උපදන සහ එකතුවන සියළු කුලී ලාභ සහ අනෙකුත් ආදයම්ද සියළු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපල, නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කිසි කළහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ,

වර්ෂ 2022ක් වූ පෙබරවාරි මස 10 වැනි දින ප. ව. 01.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

01. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැද පළාත කෝරළයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුල අංක 166 ඇඹිල්මීගම - උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇඹිල්මීගම ගමේ පිහිටි රිටිගලවත්ත *හෙවත්* මල්වත්ත නමැති ඉඩමට ඊ. කේ. ඩී. ජේ. එස්. කේ. සිරිවර්ධන අවසරලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 2002ක් වූ පෙබරවාරි මස 04 වැනි දින මැන සාදන ලද අංක 869බී දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 1 දරන කොටසට මායිම්, උතුරට : ඩබ්ලිව්. එම්. එන්. කුමාරිහාමිට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : ඩබ්ලිව්. එම්. එන්. කුමාරිහාමිට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස සඳහා කැබලි අංක 03 දරන පාර ද, දකුණට : ඩබ්ලිව්. එම්. ටිකිරි බණ්ඩා සහ තවත් අයට අයිති ගෙදරවත්ත කුඹුර ද සහ බස්නාහිරට : අස්සැද්දුමේ කුඹුරේ ඇල ද, යන මායිම් තුල පිහිටි පර්චස් විසි අට (අක්. 0, රූඩ්. 0, පර්. 28) ක් හෙවත් හෙක්ටයාර් 0.0708ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ ඊට අයත් ගහකොළ පලතුරු ආදී සියලු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී 524/109 හි ලියාපදිංචි වී ඇත.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැද පළාත කෝරළයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 166 ඇඹිල්මීගම-උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇඹිල්මීගම ගමේ පිහිටි රිටිගලවත්ත හෙවත් මල්වත්ත නමැති ඉඩමට ඊ. කේ. ඩී. ජේ. එස්. කේ. සිරිවර්ධන අවසරලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 2002ක් වූ පෙබරවාරි

මස 04 වැනි දින මැන සාදන ලද අංක 869 බී දරන පිඹුරේ ප්‍රකාර බෙද වෙන් කළ කැබලි අංක 3 දරන කොටසට මායිම්, උතුරට : ඩබ්ලිව්. එම්. එන්. කුමාරිහාමිට අයිති මෙම ඉඩමේ කොටස සහ ඩබ්ලිව්. එම්. ජේ. කුමාරිහාමිට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටසක් ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : කේ. ඉද්දවලට අයිති මෙම පිඹුරේ කැබලි අංක 02 ද සහ ඉඩමේ ඩබ්ලිව්. එම්. එන්. කුමාරිහාමිට අයිති ඉඩමේ ඉතිරි කොටස ද සහ බස්නාහිරට : කැබලි අංක 01 ද යන මායිම් තුල පිහිටි පර්චස් දොළහයි දශම දෙක (අක්. 0, රූඩ්. 0, පර්. 12.2) ක් *හෙවත්* හෙක්ටයාර් 0.0308ක් විශාල ඉඩමේ පයින් සහ වාහනවලින් ගමන් කිරීම විදුලි රැහැන් ඇදීම ජලනල එලීම ඇතුළු සියළු මාර්ග පරවශතා අයිතීන් සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉත්ඉරු අංක බී 577/132 හි ලියාපදිංචි වී ඇත.

පී. අයි. මාරසිංහ,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
දිසා අධිකරණය - කඩුවෙල.

වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් මස 10 වැනි දින දී ය.

01-138

---

**කඩුවෙල දිසා අධිකරණයේ දී ය**

විකිණීමේ දැන්වීමයි

මහනුවර, කටුගස්තොට පාර, අංක 187 හි සිය ප්‍රධාන කාර්යාලය පිහිටි සෙරෙන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්.

මහනුවර දිසා අධිකරණයේ<br>
නඩු අංකය : DMB 00068/17

................*පැමිණිලිකාර සමාගම.*

කඩුවෙල දිසා අධිකරණයේ<br>
ඇස්කීසී අංකය -

*එදිරිව*

01. මාතරගේ රුෂිරා රන්ශිකා,<br>
අංක 475, හෝමාගම පාර, අතුරුගිරිය.

02. පිටුම්පේ ආරච්චිගේ ඉන්ද්‍රා ශිරෝමි ජයසිංහ,<br>
අංක 475, හෝමාගම පාර, අතුරුගිරිය.

03. මොහොමඩ් නජ්වුදීන් නිචෝලා ඩෙස්මින්,<br>
අංක 163/1, අතුරුගිරිය පාර, මාලපල්ල, පන්නිපිටිය.

..................*විත්තිකරුවන්.*

වර්ෂ 2019ක් වූ මැයි මස 29 වැනි දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී 01 වන 02 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් හැට එක් ලක්ෂ පනස් දහස් එකසිය පනහ (රු. 6,150,150.00) ක මුදලින් මේ දක්වා ගෙවා ඇති රුපියල් හය ලක්ෂ තිස් දෙදහසක (රු. 632,000.00) මුදල අඩුකොට ඉතිරි රුපියල් පනස් පන් ලක්ෂ දහඅට දහස් එකසිය පනහ (රු. 5,518,150.00) අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා ආඥාකොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් පනස් පන් ලක්ෂ දහඅට දහස් එකසිය පනහ (රු. 5,518,150.00) ක මුදල සහ පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපලට අයත් සියළුම අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියළු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපලෙන් උපදන සහ එකතුවන සියළු කුලී ලාභ සහ අනෙකුත් ආදයම් ද සියළු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපල, නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කිසි කළහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල,

වර්ෂ 2022ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ කඩුවෙල නගර සභා සීමාව තුළ අතුරුගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අතුරුගිරිය ග්‍රාම නිලධාරි වසමේ අතුරුගිරිය ගමෙහි පිහිටි හික්ගහ වත්ත නැමැති ඉඩමට පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර අවසරලත් මිනින්දෝරුතැන විසින් වර්ෂ 2002.12.18 වැනි දින මැන සාදන ලද අංක 3005 දරන පිඹුරේ ප්‍රකාර බෙදු වෙන් කළ කැබලි අංක 3D දරන කොටසට මායිම් : උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 3C සහ 3E දරන කොටස් ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 3F දරන කොටස ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 3F දරන කොටස ද සහ බස්නාහිරට : ඩී. ඩී. පියදස සහ තවත් අය අයිතිවාසිකම් කියන කොටියන්ගේ කුඹුර සහ මෙම පිඹුරේ කැබලි අංක 3 C දරන කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ හතයි දශම බින්දුවයි දෙක (අක්. 0, රූඩ්. 0, පර්. 17.02) ක් *හෙවත්* හෙක්ටයාර් 0.0431 ක් විශාල ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, ගසකොළ, පලතුරු ආදී සියලු දේත් සමග වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී. 1338/27 හි ලියාපදිංචි වී ඇත.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල නගර සභා සීමාව තුළ අතුරුගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අතුරුගිරිය ග්‍රාම නිලධාරි වසමේ අතුරුගිරිය ගමෙහි පිහිටි හික්ගහවත්ත නැමැති ඉඩමට පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර අවසරලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 2002/12/18 වැනි දින මැන සාදන ලද අංක 3005 දරන පිඹුරේ ප්‍රකාර බෙදු වෙන් කළ කැබලි අංක 3E දරන කොටසට මායිම්, උතුරට : අංක 532 දරන පිඹුරේ කැබලි අංක 02 ද, නැගෙනහිරට : ජී. ඒ. අන්දිරිස්හාමිට අයිති හික්ගහවත්ත ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 3F, 3D, 3C දරන කොටස් ද සහ බස්නාහිරට : මෙම පිඹුරේ කැබලි අංක 3B දරන කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දෙකයි දශම නමයයි එක (අක්. 0, රූඩ්. 0, පර්. 2.91) ක් විශාල කොටසේ මාර්ග අයිතිය ද සමග වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී. 1338/28 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - කඩුවෙල.

වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින දී ය.

01-139

---

# නොතාරිස් ලැයිස්තුව

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

344 A, බාර් පාර, මඩකලපුව දරන ලිපිනයේ පදිංචි නාගරත්නම් කිරිෂ්ණපිරියන් වන මම, මඩකලපුව දිස්ත්‍රික්කය තුළ දමිළ භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් වශයෙන් ඇතුළත්වීමට, නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 07 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

නාගරත්නම් කිරිෂ්ණපිරියන්.

2022 ජනවාරි මස 03 වැනි දින,
344 A,
බාර් පාර, මඩකලපුව.

01-65

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි**

අංක 09, ඔට්ටුපල්ලි හරස් පාර, එරාවූර් - 06 දරන ලිපිනයේ පදිංචි අබ්දුල් මජීඩ් මුහම්මද් නාීස් වන මම, මඩකලපුව දිස්ත්‍රික්කය තුළ දමිළ භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

අබ්දුල් මජීඩ් මුහම්මද් නාීස්.

2022 ජනවාරි මස 03 වැනි දින,
අංක 09,
ඔට්ටුපල්ලි හරස් පාර,
එරාවූර් - 06

01-66

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි**

ප්‍රධාන පාර, පුදුකුඩියිරුප්පු (30158), මඩකලපුව දරන ලිපිනයේ පදිංචි සුන්දරරාජන් ඩිනෝෂන් වන මම, මඩකලපුව දිස්ත්‍රික්කය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 07 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

සුන්දරරාජන් ඩිනෝෂන්.

2022 ජනවාරි මස 04 වැනි දින,
ප්‍රධාන පාර,
පුදුකුඩියිරුප්පු (30158),
මඩකලපුව

01-80

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි**

අංක 199 A, මාවඩි පාර, සායින්දමරුදු - 6 දරන ස්ථානයේ පදිංචි මොහිදීන් බාවා මොහොමඩ් ෆවුසාන් වන මම, අම්පාර දිස්ත්‍රික්කයේ මහාධිකරණය කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 07 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

එම්. බී. එම්. ෆවුසාන්.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
අංක 199 A,
මාවඩි පාර,
සායින්දමරුදු - 6

01-129

# විවිධ දැන්වීම්

**බයෝමාස් සප්ලයීස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

**සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 76480**

**2007 අංක 07 දරන සමාගම් පනතේ 270 (e) සහ (f) වගන්ති යටතේ සමාගම ගනුදෙනු බේරා වසාලීම පිළිබඳ නිවේදනයයි**

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | බයෝමාස් සප්ලයීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | 165/6, උද්‍යාන පාර, කොළඹ 05. |
| අධිකරණය | : | බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| විෂයකරුනේ අංකය | : | HC/CIVIL/96/2021/CO |
| පෙත්සම ඉදිරිපත් කළ දිනය | : | 2021 දෙසැම්බර් 15 |
| පෙත්සම්කරුගේ නම සහ ලිපිනය | : | බයෝමාස් සප්ලයීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,<br><br>(Biomass Supplies (Private) Limited,<br>අංක 165/6, උද්‍යාන පාර, කොළඹ 05. |

පෙත්සම්කරුගේ ලියාපදිංචි නීතිඥවරයාගේ නම සහ ලිපිනය :

නීතිඥ කාංචන සේනානායක,
35 වැනි මහල,
බටහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය (WTC),
කොළඹ 01.

1939 සමාගම් ගනුදෙනු බේරා වසා දැමීම පිළිබඳ රීතින්හි 7 වැනි රීතියේ විධිවිධානයන්ට අනුව, පෙත්සම විභාගයට ගෙන අසනු ලබන අවස්ථාවේ දී එයට විපක්ෂව හෝ පක්ෂව පෙනී සිටීමට අදහස් කරන යම් අයෙකු වෙතොත් 13 වැනි රීතියේ නියම කර ඇති කාල වේලාවන් තුළදී ඔහුගේ අභිලාෂය පිළිබඳ නිවේදනය පෙත්සම්කරුට හෝ ඔහුගේ/ඇයගේ ඉහත සඳහන් නීතිඥවරයා හට ලැබෙන්නට සැලැස්විය යුතුය.

01-128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.